# පානම්පත්තු ප්‍රාදේශීය ඒකකයට ආවේණික වූ මඩේනැටීම ශාන්තිකර්මයෙහි වර්තමාන අනාගත ප්‍රවණතා පිරික්සීමක්

කුමාරි අයි.ඒ.වී.පී.කේ., කුමාරි බී.එස්.පී. සහ සෙව්වන්දි කේ.ඩී.සී.

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
priyamalikalani@gmail.com

**සාරසංක්ෂේපය**

ශ්‍රී ලංකාව භූමි ප්‍රමාණයෙන් ඉතා කුඩා රටක් වූවත් සංස්කෘතිමය විවිධත්වය අතින් පුළුල් පරාසයක විහිදී ඇති සමාජයකට හිමිකම් කියයි. රටේ විවිධ ප්‍රදේශයන්හි ඒකරාශී වූ ජන කොට්ඨාස ඔවුනට ආවේණික සංස්කෘතිකාංග ඇසුරින් උප සංස්කෘතික ඒකක ගොඩනගාගෙන තිබේ. නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ පානම්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම ග්‍රාමය ද ව්‍යවහාරික, ක්‍රියාකාරි මෙන්ම වාග්විද්‍යාත්මක අස්පෘෂ සංස්කෘතික උරුමයන් ඒකරාශී වූ උප සංස්කෘතික ඒකකයක් ලෙස හඳුනාගත හැකිය. මෙම ප්‍රදේශයේ හඳුනාගත හැකි සංස්කෘතිකාංගයක් වන 'මඩේනැටීම' නම් ශාන්තිකර්මය හා ඒ ආශ්‍රිතව හඳුනාගත හැකි වර්තමාන අනාගත ප්‍රවණතා අධ්‍යයනයට ලක් කිරීම මෙහිදී සිදු කරන ලදී. එහිදී සම්මුඛ සාකච්ඡා සහ සහභාගීත්ව නිරීක්ෂණයෙහි යෙදීම මූලිකව සිදු කරන ලද්දේ උප සංස්කෘතිකාංගයක් පිළිබඳව අධ්‍යයනය කළ හැකි සාර්ථකම ක්‍රමවේදයන් වන්නේ එම ක්‍රමවේදයන් වීම හේතුවෙනි. ඊට අමතරව පුස්තකාල ගවේශණයේ යෙදීම ද සිදු කරන ලදී. උක්ත අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පානම උප සංස්කෘතික සමාජයේ බිහිවී, එහිම පෝෂණය වී වර්තමානය වන විට ක්‍රමයෙන් වියකී යන 'මඩේනැටීම' නම්වන ශාන්තිකර්මය පිළිබඳවත් එහි ඇති වර්තමාන අනාගත පැවැත්මේ ප්‍රවණතා හැදෑරීමත්ය. හින්දු සංස්කෘතිකාංගයන් ද සහිත වන මෙම ශාන්තිකර්මය කාත්තස්වාමි, නරසිංහභෛරව හා පත්තිනි දේව මෑණියන් උදෙසා සිදු කරනු ලබයි. මේ වෙනුවෙන් මොවුන් සතියක කාලයක සිට පේවී සූදානම් වෙයි. පළමු පියවර වශයෙන් තිරරෙදි හා දේව රූප සකස් කිරීම සිදු කරනු ලැබේ . මේ සඳහා අවශ්‍ය කරනු ලබන්නේ වෙස් මුහුණු, ඇඳුම්, කොහොඹ කොළ මිටි, කෙසෙල් කැන්, කිරි හා සීනි යොදා පිසගත් දානය, හාල් පිටිවලින් සකසාගත් රොටී, කැවුම් ආදියයි. ශාන්තිකර්මය ආරම්භ කරනුයේ දෙවියන් සතුටුකිරීම අපේක්ෂාවෙන් දෙවිවරුන් තිදෙනා වෙනුවෙන් නර්තනයේ යෙදීමෙනි. පසුදින පාන්දර වන තුරු ශාන්තිකර්මය සිදු කරනු ලබන අතර, මෙහි දී අසනීප තත්වයෙන්ගෙන් පසුවන පුද්ගලයන්, අපල උපද්‍රව සහිත වූවන් දේව ආශිර්වාදය ලැබීමට රැස් වෙති. මෙම ශාන්තිකර්මය බොහෝවිට වර්තමානයේ හඳුනාගත නොහැකි ශාන්තිකර්මයකි. ඊට හේතු වශයෙන් හඳුනාගත හැකි වූයේ මෙම ශාන්තිකර්මය පාරම්පරිකව පවත්වාගෙන එනු ලැබූ පරම්පරාවන්හි නිමාව හෝ එම පරම්පරාවන්හි ඉතිරිව ඇති වර්තමාන පරපුර එම පුද සිරිත් පවත්වාගෙන ඒමට පොදු සමාජ ආකල්ප මත දක්වනු ලබන අකමැත්ත හේතුවෙන් අභාවයට යමින් පැවතීමයි. මෙම අධ්‍යයනය අවසානයේ නිගමනය කළ හැක්කේ පානම උප සංස්කෘතික ඒකකය තුළ පවතින බොහෝ අස්පෘෂ්‍ය උරුමයන් මෙන් මඩේනැටීම ශාන්තිකර්මය ද ක්‍රමයෙන් එකී උප සංස්කෘතියෙන් ගිලිහි යන බවයි.

**ප්‍රමුඛ පද:** *උප සංස්කෘතිය, අස්පෘෂ උරුමය, මඩේනැටීම, ශාන්තිකර්ම, ප්‍රවණතා*